# නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය

කාර්යය සාධන වාර්තාව හා වාර්ෂික ගිණුම්

**2012**

# மீள் குடியேற்ற அமைச்சு

**செயலாற்று அறிக்கையும் வருடாந்த கணக்கும்**

2012

# *Ministry of Resettlement*

*Performance Report and Annual Accounts*

***2012***

# නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය

## කාර්යය සාධන වාර්තාව හා වාර්ෂික ගිණුම්

## 2012

ශීර්ෂය - 145


අංක 146,

ගාලු පාර,

කොළඹ 03.

## ➢ දැක්ම

"නැවත පදිංචි කිරීමෙන් අනතුරුව සාර්ථක ලෙස ජාතික ආර්ථිකයට සහ සමාජයට ඵලදායි ලෙස දායක වන තෘප්තිමත් ප්‍රජාවක්."

## ➢ මෙහෙවර

"උතුරු නැගෙනහිර පැවති ගැටුම් හේතුවෙන් අවතැන්වූ ජනතාව නැවත පදිංචි කිරීම, අවශ්‍ය සහන සැලසීම, ජන ජීවිතය නැංවීම.

අවශ්‍ය සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම කාර්යක්ෂම හා ඵලදායී ලෙස සිදුකිරීම තුළින් සමාජය තුළ ගෞරවාන්විතවූ සුරක්ෂිත ජන ජීවිතයක් තහවුරු කිරීම".

***පටුන***


**01 හැඳින්වීම** **1**

**02 අමාත්‍යාංශයේ අරමුණු** **2**

**03 අමාත්‍යාංශය ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්** **2**

**04 අවතැන්වූ ජනතාව වෙනුවෙන් විවිධ අංශ යටතේ පහසුකම් සැලසීම**

04.01 ආරක්ෂාව
04.02 නැවත පදිංචි කිරීම
04.03 අත්‍යවශ්‍ය සේවා සම්පාදනය
04.04 යටිතල පහසුකම් සම්පාදනය හා ජීවනෝපාය මාර්ග සලසා දීම
04.05 අවතැන්වූ ජනතාවගේ අයිතිවාසිකම් සුරැකීම

**05 මැණික් ෆාම් සහන ගම්මානය වසා දැමීම** **4**
05.01 සහන ගම්මාන තඩත්තු කිරීම

**06 වාර්ෂික වැඩසටහන් සැලැස්ම ඉලක්ක හා තිමැවුම් - 2012** **6**

**07 වැඩසටහන් අනුව විසර්ජණ ගිණුම – 2012** **7-9**
07.01 පුනරාවර්ථන වියදම් හා මූලධන වියදම් සාරාංශය
07.01.01 මෙහෙයුම් ක්‍රියාකාරකම්
07.02.02 සංවර්ධන ක්‍රියාකාරකම්

**08 ව්‍යාපෘති අනුව පුනරාවර්ථන වියදම්** **10-11**
08.01 අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශ පරිපාලනය
08.02 ගැටුම් වලින් පීඩාවට පත් වූ ජනතාව නැවත පදිංචි කිරීමේ වැඩසටහන

**09 ව්‍යාපෘති අනුව මූලධන වියදම්** **12-14**
09.01 මෙහෙයුම් ක්‍රියාකාරකම්
09.01.01 අමාත්‍ය කාර්යාලය
09.01.02 අමාත්‍යාංශ පරිපාලනය

09.02 සංවර්ධන ක්‍රියාකාරකම්
09.02.01 ගැටුම් වලින් පීඩාවට පත් වූ ජනතාව නැවත පදිංචි කිරීමේ වැඩසටහන

**10 වියදම් මූල්‍යකරණ සාරාංශය** **15**
10.01 මෙහෙයුම් ක්‍රියාකාරකම් සහ සංවර්ධන ක්‍රියාකාරකම්

**11 වියදම් මූල්‍යකරණය** **16-17**
11.01 මෙහෙයුම් ක්‍රියාකාරකම්
11.02 සංවර්ධන ක්‍රියාකාරකම්

**12 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ සැසඳුම් ප්‍රකාශය** **18-20**
12.01 පුද්ගල ණය ශේෂ සාරංශය
12.02 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් සහ ණය සඳහා පාලන ගිණුම

**13 විගණන වාර්තාව** **21-22**
13.01 විගණන විමසුම්
13.01 විගණකාධිපතිගේ සටහන්

## හැඳින්වීම

2010 අප්‍රේල් මස 30 වෙනි දින අංක 1651/20 දරණ ගැසට් නිවේදනයට අනුව නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය මහින්ද චින්තනයට හා ජාතික ප්‍රතිපත්තිවලට අනුව උතුරු හා නැගෙනහිර පළාත්වල නැවත පදිංචි කිරීමේ කටයුතු වලට අදාළ සැලසුම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ස්ථාපිත කරන ලදි.

අමාත්‍යාංශ කාර්යමණ්ඩලය ලේකම්වරයා හා අනුමත කාර්යමණ්ඩල 126 කින් සමන්විත වේ. එයින් 11 දෙනෙකු ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් වේ. ද්විතික හා ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් 111ක් වන අතර, තෘතීය මට්ටමේ නිලධාරීන් 04, දෙනෙකුගෙන් සමන්විත වේ. ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් වනුයේ අතිරේක ලේකම්, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ප්‍රධාන ගණකාධිකාරී හා අධ්‍යක්ෂ (සංවර්ධන) යන නිලධාරීන්ය. එසේම දීප ව්‍යාප්ත සේවාවන්ට අදාළ නිලධාරීන් 06 දෙනෙක්ද මෙම අමාත්‍යාංශයේ සේවය කරයි.

තවද උතුරු හා නැගෙනහිර පළාත්වල නැවත පදිංචි කිරීමේ කටයුතු සම්බන්ධීකරණය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මෙම අමාත්‍යාංශය මගින් අනුයුක්ත කරන ලද සංවර්ධන සහකාරවරුන්ද ඇත.

## අමාත්‍යාංශයේ අරමුණු

- සහන ගම්මාන නඩත්තු කිරීම තුලින් අභ්‍යන්තරිකව අවතැන්වූ ජනතාව වෙත නිසි ආරක්ෂාව සැලසීම සහ ඔවුන් වෙත මානුෂීය ආධාර සහ සහන සැලසීම.
- අභ්‍යන්තරික අවතැන්වූවන් හා විදේශ රටවල සරණාගතයින් වශයෙන් ගොස් ආපසු පැමිණි ජනතාව ඔවුන්ගේ මුල් ගම් බිම් වල පදිංචි කරවීම.
- අවතැන්වූ ජනතාව විකල්ප ස්ථාන වල පදිංචි කිරීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම හා අවශ්‍ය පහසුකම් සැලසීම.
- රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධීකරණය තුලින් එකී පහසුකම් සම්පාදනය.
- ආධාර ලබාදෙන ආයතන වලින් ලැබෙන්නාවූ සම්පත් ප්‍රයෝජනවත් ලෙස හා නිසි ලෙස වියදම් දරන බවට තහවුරු කිරීම.
- අභ්‍යන්තරිකව අවතැන්වූවන් හා සරණාගතයින් රටෙහි සංවර්ධන ක්‍රියාදාමයන්ට දායක කරවීම හා සෙසු ජනතාව සමග ජීවත් කරවීම සඳහා වූ නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය නිශ්චිතව තහවුරු කිරීම.

## අමාත්‍යාංශය ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්

- අභ්‍යන්තරව අවතැන්වූ ජනතාව නැවත පදිංචි කිරීම.
- එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහලේකම් කාර්යාලය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව හා වෙනත් ආධාර සහිතව නැවත පදිංචි කිරීමේ කටයුතු වලට අදාළ ව්‍යාපෘති සම්බන්ධීකරණය.
- සරණාගතයින් නැවත පදිංචි කිරීම.
- නැවත පදිංචි කිරීම සහ සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය.
- සාමාන්‍ය ජන ජීවිතය යථා තත්ත්වයට පත්කරලීමේදී අදාළ රාජ්‍ය අංශයේ සහ රාජ්‍ය නොවන සංවිධාන වලට සහාය වීම.
- යළි පදිංචි කරවීමේ කටයුතු වලදී රජයේ ආයතන, දානපති නියෝජිත ආයතනයන්, රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සමාජය අතර කටයුතු සම්බන්ධීකරණය පහසු කරලීම.
- අභ්‍යන්තරව අවතැන්වූ ජනතාව විකල්ප ස්ථාන වල ප්‍රතිස්ථාපිත කිරීම.
- එසේ විකල්ප ස්ථානවල ප්‍රතිස්ථාපිත කළ ජනතාව සඳහා නව නිවාස ඉදිකිරීම.
- අවතැන්වූ ජනතාව සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

# අවතැන්වූ ජනතාව වෙනුවෙන් විවිධ අංශ යටතේ පහසුකම් සැලසීම

## ආරක්ෂාව

උතුරු නැගෙනහිර පැවති ගැටුම් හේතුවෙන් අවතැන්වූවන් තාවකාලිකව පදිංචි කරන ලද සහන ගම්මාන නඩත්තු කිරීම සහ ඔවුන් රැකබලා ගැනීම මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරයකි. එමෙන්ම, ඔවුන් සිය මුල් වාසස්ථානවල හෝ සුදුසු විකල්ප ස්ථාන වල නැවත පදිංචි කරවන තෙක් ඔවුන්ගේ මූලික අවශ්‍යතා සහ අනෙකුත් පොදු පහසුකම් සැපයීම මෙන්ම ඔවුන්ව ආරක්ෂාකාරීව රැකබලා ගැනීමේ වගකීම තහවුරු කර ඇත.

## නැවත පදිංචි කිරීම

නැවත පදිංචි කිරීමේ මූලික ක්‍රමවේදය වන්නේ අවතැන්වූවන් මුල් ගම්බිම් වල හෝ ඔවුන් කැමති සුදුසු විකල්ප ස්ථාන වල පදිංචි කරවීමයි. බිම් බෝම්බ වළලා ඇති ප්‍රදේශ වලින් බිම් බෝම්බ ඉවත් කර ආරක්ෂාව තහවුරු කිරීමෙන් පසු අවතැන්වූ ජනතාව නැවත පදිංචි කිරීම සිදුකරනු ලැබේ. ඔවුන්ගේ මුල් ගම්බිම් වල නැවත පදිංචි වීම සහ ඔවුනගේ දේපල බුක්ති විඳීමේ අයිතිය අවතැන්වූවන් සතුය. එහෙත් එම ප්‍රදේශවල වළලා ඇති බිම් බෝම්බ ඉවත් කර ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයන් සපුරාදී ගෞරවාන්විත ලෙස ජීවත්වීමේ පසුබිම සකස් කර දීම නැවත පදිංචි කිරීමේ වැඩසටහනේ ප්‍රධාන අංගයක් වී ඇත. නැවත පදිංචි වන පවුල් සඳහා ලෝක ආහාර වැඩසටහන යටතේ මාස 06කට අවශ්‍ය වියළි ආහාර, එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ අනුග්‍රහය ඇතිව රුපියල් 25,000.00ක නිවාස ආධාර, කෘෂි උපකරණ, ප්‍රවාහන පහසුකම්, පානීය ජලය ඇතුළු අත්‍යාවශ්‍ය පහසුකම් ලබාදීමටත්, ජීවනෝපාය මාර්ග ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් ලබාදී ඔවුන්ගේ ජීවන තත්ත්වය නගාසිටුවීමටත් අමාත්‍යාංශය කටයුතු කර ඇත.

## අත්‍යවශ්‍ය සේවා සම්පාදනය

උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල පැවති ගැටුම් හේතුවෙන් අවතැන්ව පැමිණි ජනතාවට අවශ්‍ය පිසූ ආහාර, වියළි ආහාර, වාසස්ථාන ආරක්ෂාව ඇතුළු වෙනත් අත්‍යවශ්‍ය සේවා සැපයීම ප්‍රධාන අරමුණක් වී ඇත. මෙහිදී ගැටුම් හේතුවෙන් අභ්‍යන්තරිකව අවතැන්ව සුභසාධන මධ්‍යස්ථාන හා වෙනත් බැහැර ස්ථානයන්හී වෙසෙන අවතැන්වූවන්ට අත්‍යවශ්‍ය අහාර ද්‍රව්‍ය සැපයීම, අවතැන්වූ පුද්ගලයන් සඳහා සහන ගම්මාන හා සහන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම, නැවත පදිංචි කරවන පවුල් සඳහා පිසූ ආහාර සහ වියළි සළාක සහනාධාර ලබාදීම සහ අවතැන්වූවන් සඳහා අදාල වෙනත් සේවාවන් සැපයීමට අමාත්‍යාංශය කටයුතු යොදා ඇත.

## යටිතල පහසුකම් සම්පාදනය හා ජීවනෝපාය මාර්ග සළසා දීම

නැවත පදිංචි කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පෙර අවතැන්වූ ජනතාව යථා තත්ත්වයට ගෙන ඒම සඳහා ආර්ථික, සාමාජීය හා යටිතල පහසුකම් සළසා දිය යුතුය. ඒ සඳහා මාර්ග , රෝහල්, පාසැල්, විදුලිය, බලශක්තිය, වෙළඳපොළ, පානීය ජල සහ සනීපාරක්ෂක පහසුකම් හා පොදු සේවාවන් පළමුව යථා තත්ත්වයට පත් කළ යුතුය. නිවාස අළුත්වැඩියාව, ප්‍රතිසංස්කරණය හා ගොඩනැගීම දෙවනුව සිදු කළ යුතුව ඇත. ජාත්‍යන්තර සහ දේශීය රාජ්‍ය නොවන සංවිධාන වල සහයෝගයෙන් ප්‍රතිසංස්කරණ කටයුත කඩිනම් කිරීම සඳහා රජය ක්‍රියා කර ඇත. අමාත්‍යාංශය මගින් ජීවනෝපාය මාර්ග සළසා දීම සහ මානව සම්පත් සංවර්ධන කටයුතු දියත් කිරීමද සිදු කරනු ලබයි.

## අවතැන්වූ ජනතාවගේ අයිතිවාසිකම් සුරැකීම

අවතැන්වූ ජනතාව සිය මුල් වාසස්ථාන වල පදිංචි කිරීමේදී ඔවුන් වෙත අවශ්‍ය වන්නාවූ ආර්ථික සාමාජීය පහසුකම් සපයා දීමේ කාර්යය ඉටුකරමින් තෝරාගත් ස්ථානවල හෝ මුල් වාසස්ථානවල පදිංචි කිරීමේදී අන්තර් ජාතික ප්‍රමිතීන්ට අනුකූලව ඔවුනගේ අයිතිවාසිකම් උපරිම අයුරින් සුරැකෙන පරිදි ක්‍රියා කරනු ලැබේ. එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල සහ මානව හිමිකම් කොමිසන් සභාව සමග සම්බන්ධීකරණය වෙමින් මේ පිළිබඳව අවශ්‍ය වන්නාවූ කටයුතු සම්පාදනය කරනු ලැබේ.

## මැණික් ෆාම් සහන ගම්මානය වසා දැමීම

එල්. ටී. ටී ඊ. සංවිධානය විසින් බලහත්කාරයෙන් රඳවාගෙන මිනිස් පලිහක් ලෙස සිරකරගෙන සිටි සාමාන්‍ය ජනතාව බේරාගැනීම සඳහා ආරක්ෂක අංශ විසින් සිදුකරන ලද මානුෂීය මෙහෙයුම් තුළින් අහිංසක සිවිල් ජනතාව රජයේ පාලන ප්‍රදේශ වෙත 2009 මුල් භාගයේදී පැමිණෙන්නට විය. ගොඩබිම් මාර්ග හා මුහුදු මාර්ග උපයෝගී කරගෙන එම පිරිස් පැමිණෙන ලදි. මෙලෙස පැමිණි ජනතාව ඕමන්ත මුරපොළ හරහා වවුනියාව ප්‍රදේශයටත්, තවත් පිරිසක් යාපනය හා ත්‍රිකුණාමලය ප්‍රදේශයටත් පැමිණෙන්නට විය. එලෙස පැමිණි ජනතාව පාසැල්, ආගමික සිද්ධස්ථාන ඇතුළු පොදු ස්ථානවල තාවකාලිකව පදිංචි කර අවශ්‍ය පහසුකම් ලබාදීමට කටයුතු කරන ලදි. රජයේ පාලන ප්‍රදේශ වලට පැමිණෙන ජනතාව වැඩිවීමත් සමග අනෙකුත් පොදු සේවාවන් අඩාල වීම වැළැක්වීමටත් රජය කඩිනම් ව්‍යාපෘතියක් ලෙස සහන ගම්මාන ඉදිකිරීමට කටයුතු කරන ලදි. එහිදී නැවත පදිංචි කිරීමේ

හා ආපදා සහන සේවා අමාත්‍යාංශය අනෙකුත් සියලුම අමාත්‍යාංශ වල සහයෝගය ඇතිව එම කටයුතු ආරම්භ කරන ලදි. ඒ අනුව වවුනියාව මැණික්ෆාම් ප්‍රදේශය කේන්ද්‍ර කොටගෙන ආනන්ද කුමාරස්වාමි, අරුණාචලම්, කදිරගාමර්, රාමනාදන් යන ගම්මාන හතර ඉදිකරන ලදි. එම ගම්මාන ආදර්ශ ගම්මාන ආකාරයට ඉදිකරන ලද අතර ජනතාවට අවශ්‍ය සියලු මූලික පහසුකම් ඒ තුළ ස්ථාපිත කරන ලදි.

සහන මධ්‍යස්ථාන ලෙස යොදාගත් පාසැල් වල අධ්‍යාපන කටයුතු බාධාවකින් තොරව ගෙනයාම සඳහා කලාප 4, කලාප 5 සහ කලාප 6 යන ගම්මාන පසුව ඉදිකරන ලදි. ඒ අනුව පාසල් හා සියලුම පොදු ස්ථාන වල සිටි ජනතාව එම ගම්මාන තුළ තාවකාලිකව නැවත පදිංචි කරන ලදි. ඔවුනට අවශ්‍ය නිවාස, ආහාර (පිසූ හා වියළි), පානීය ජලය, වැසිකිලි, පාසල්, පෙර පාසල්, පුස්තකාල , රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන, තැපැල් කාර්යාල, දුරකථන, බැංකු, සමූපකාර, එළවළු හා මාළු වෙළඳසැල්, කොණ්ඩා කපන ස්ථාන, විදුලිය ළමා උද්‍යාන, ජංගම වෛද්‍ය සායන ඇතුළු අත්‍යාවශ්‍ය පහසුකම් ලබාදීමට රජය කටයුතු කරන ලදි. ඉන්පසු ආරම්භ කරන ලද නැවත පදිංචි කිරීමේ වැඩසටහනත් සමග අදියරෙන් අදියර සහන ගම්මාන වසා දමමින් නැවත පදිංචි කිරීමේ වැඩ පිළිවෙල සාර්ථකව ඉදිරියට ගෙන යාමට අමාත්‍යාංශය සිය කාර්යභාරය මෙහෙයවන ලදි. 2012 වර්ෂය වන විට පැවති කදිරගාමර් සහ ආනන්ද කුමාරස්වාමි සහන ගම්මාන දෙකෙහි ජනතාවද 2012 සැප්තැම්බර් 24 වන දින වන විට සිය මුල් ගම්බිම් වල පදිංචි කරවමින් එම සහන ගම්මාන වසා දැමීමට රජයට හැකිවිය.

## සහන ගම්මාන නඩත්තු කිරීම

සහන ගම්මාන නඩත්තු කිරීම සඳහා 2012 වර්ෂයේ රුපියල් මිලියන 57ක මුදලක් වැයකර ඇත. ඒ යටතේ සහන ගම්මාන වල සිටි පිරිස සඳහා අවශ්‍ය නිවාස ආහාර, (පිසූ හා වියළි) පානිය ජලය, වැසිකිලි, පාසැල්, පෙර පාසල්, පුස්ථකාල, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන, තැපැල් කාර්යාල , දුරකථන, බැංකු, සමූපකාර, එළවළු හා මල් වෙළඳසැල්, කොණ්ඩා කපන ස්ථාන, විදුලිය, ළමා උද්‍යාන, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ඇතුලු පහසුකම් ලබාදීමට කටයුතු කරන ලදි.

## වාර්ෂික වැඩසටහන් සැලැස්ම ඉලක්ක හා නිමැවුම් - 2012

| අනු අංක | නිමැවුම් | ඉලක්ක | 20121231 දක්වා |
|---|---|---|---|
| | | | |
| | **ඉදිකරන ලද ස්ථිර නිවාස සංඛ්‍යාව** | | |
| 1 | වැලිඔය නිවාස | 500 | 210 |
| 2 | කේපාපිලවු | 50 | 50 |
| 3 | සින්තනවේලි | 56 | 56 |
| 4 | කෝම්බාවිල් තාවකාලික නිවාස | 200 | 200 |
| | **එකතුව** | **806** | **516** |
| | **ඉදිකරන ලද ස්ථිර වැසිකිළි සංඛ්‍යාව** | | |
| 1 | වැලිඔය | 108 | 108 |
| 2 | කේපාපිලවු | 90 | 90 |
| 3 | කෝම්බාවිල් | 200 | 200 |
| | **එකතුව** | **398** | **398** |
| | **ඉදිකරන ලද ස්ථිර නල ළිං සංඛ්‍යාව** | | |
| 1 | කේපාපිලවු | 15 | 15 |
| 2 | තෙන්නමරවාඩි | 6 | 6 |
| 3 | වැලිඔය | 4 | 3 |
| | **එකතුව** | **25** | **24** |
| | | | |
| | පදිංචි කරන ලද අවතැන්වූවන් සංඛ්‍යාව | 9,064 | 38,025 |
| | මුදල් ප්‍රදාන ලබාදෙන ලද පවුල් සංඛ්‍යාව | 2,000 | 4,243 |
| | නැවත පැමිණි සරණාගතයින්ගෙන් පදිංචි කළ සංඛ්‍යාව | 1,500 | 1,291 |
| | **එකතුව** | **12,564** | **43,559** |
| | | | |
| | **නඩත්තු කරන ලද කඳවුරු සංඛ්‍යාව** | | |
| | යාපනය | 39 | 39 |
| | ත්‍රිකුණාමලය | 3 | 3 |
| | **එකතුව** | **42** | **42** |
| | **පිසූ ආහාර ලබාදෙන ලද පවුල් සංඛ්‍යාව** | | |
| | යාපනය | 1,798 | 1,798 |
| | මුලතිවු | 6,543 | 6,543 |
| | **එකතුව** | **8,341** | **8,341** |
| | | | |
| | **අභ්‍යන්තර මාර්ග/ කිමී.** | | |
| | මුලතිවු සිට කේපාපිලවු දක්වා | 7 | 7 |
| | | | |
| | **වනාන්තර එළිපෙහෙළි කිරීම් (අක්කර)** | | |
| | මුලතිවු | 200 | 200 |
| | | | |
| | **නැවත පදිංචි කිරීමේ උපාංග සඳහා ප්‍රතිපාදන** | | |
| | කැලැබෝගස්වැව ගම්මානය – පවුල් 150 | | 3.45 මිලියන |

# විසර්ජන ගිණුම 2012

වියදම් ශීර්ෂ අංකය: **145** අමාත්‍යාංශයේ නම : **නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය**

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මු.රෙ. 66 සහ 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම් (4-5) | සටහන් අංකය (අදාල ඩී.ජී.එස්.ඒ 2 අකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| | <u>පුනරාවර්තන</u> | | | | | | | |
| 1 | මෙහෙයුම් ක්‍රියාකාරකම් | 138,020,000 | 0 | 0 | 138,020,000 | 130,823,183 | 7,196,817 | **2** |
| 2 | සංවර්ධන ක්‍රියාකාරකම් | 134,535,000 | 0 | -46,650,000 | 87,885,000 | 69,308,129 | 18,576,871 | 3 |
| | **උප එකතුව (පුනරාවර්තන)** | **272,555,000** | 0 | -46,650,000 | 225,905,000 | 200,131,312 | 25,773,688 | |
| | <u>මූලධන</u> | | | | | | | |
| 1 | මෙහෙයුම් ක්‍රියාකාරකම් | 15,950,000 | 9,420,155 | 5,200,000 | 30,570,155 | 27,649,073 | 2,921,082 | **2** |
| 2 | සංවර්ධන ක්‍රියාකාරකම් | 193,100,000 | 144,472,400 | 41,450,000 | 379,022,400 | 318,121,786 | 60,900,614 | 3 |
| | **උප එකතුව (මූලධන)** | **209,050,000** | **153,892,555** | 46,650,000 | 409,592,555 | 345,770,859 | 63,821,696 | |
| | **මුළු එකතුව** | **481,605,000** | **153,892,555** | **0** | 635,497,555 | 545,902,171 | 89,595,384 | |

# වැඩසටහන් අනුව විසර්ජන ගිණුම - 2012

වියදම් ශීර්ෂ අංකය: **145** අමාත්‍යාංශයේ නම : **නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය**

වැඩසටහන් අංකය හා නාමය : **1 - මෙහෙයුම් ක්‍රියාකාරකම්**

## පුනරාවර්තන හා මූලධන වියදම් සාරාංශය

| වියදමෙහි ස්වභාවය ( ඩී.පී.එස්.ඒ ආකෘති යොමුව සමග) | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරිම් | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරිම් | (3) මු.රෙ 66 සහ 69 අනුව මාරු කිරිම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම් (4-5) | පිටු අංකය (අදාල ඩී.පී.එස්.ඒ ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| (අ) පුනරාවර්තන (ඩී.පී.එස්.ඒ. 3) | 138,020,000 | | | 138,020,000 | 130,823,183 | 7,196,817 | **1** |
| (ආ) මූලධන (ඩී.පී.එස්.ඒ. 4) | 15,950,000 | 9,420,155 | 5,200,000 | 30,570,155 | 27,649,073 | 2,921,082 | **1** |
| එකතුව | 153,970,000 | 9,420,155 | 5,200,000 | 168,590,155 | 158,472,256 | 10,117,899 | |

# වැඩසටහන් අනුව විසර්ජන ගිණුම - 2012

වියදම් ශීර්ෂ අංකය: **145** අමාත්‍යාංශයේ නම : **නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය**

වැඩසටහන් අංකය හා නාමය : **2 - සංවර්ධන ක්‍රියාකාරකම්**

## පුනරාවර්තන හා මූලධන වියදම් සාරාංශය

| වියදමෙහි ස්වභාවය ( ඩී.ජී.එස්.ඒ ආකෘති යොමුව සමග) | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මු.රෙ 66 සහ 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම් (4-5) | ඕටු අංකය (අදාල ඩී.ජී.එස්.ඒ ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| (අ) පුනරාවර්තන (ඩී.ජී.එස්.ඒ. 3) | 134,535,000 | | -46,650,000 | 87,885,000 | 69,308,129 | 18,576,871 | 1 |
| (ආ) මූලධන (ඩී.ජී.එස්.ඒ. 4) | 193,100,000 | 144,472,400 | 41,450,000 | 379,022,400 | 318,121,786 | 60,900,614 | 1 |
| එකතුව | **327,635,000** | **144,472,400** | **-5,200,000** | **466,907,400** | **387,429,915** | **79,477,485** | |

# ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම්

වියදම් ශීර්ෂ අංකය : **145** අමාත්‍යාංශයේ නම : **නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය**

වැඩ සටහන් අංකය හා නාමය : **1-2 අමාත්‍ය කාර්යාලය හා අමාත්‍යාංශ පරිපාලනය**

| | (1) | (2) | (3) | (4) | (5) | (6) |
|---|---|---|---|---|---|---|
| **වයාපෘති අංකය / නම, පුද්ගලික පඩිනඩි සහ සියළුම වයාපෘති සඳහා අනෙකුත් අයකිරීම්** | **අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම්** | **පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම්** | **මු.රෙ.66, 69 අනුව මාරු කිරීම්** | **මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3)** | **මුළු වියදම්** | **ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (4-5)** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වයාපෘති අංකය..1.. හා නම : අමාත්‍ය කාර්යාලය | | | | | | |
| පුද්ගල පඩිනඩි | 17,200,000 | | | 17,200,000 | 16,555,378 | 644,622 |
| අනෙකුත් වියදම් | 27,400,000 | | | 27,400,000 | 25,542,375 | 1,857,625 |
| උප එකතුව | **44,600,000** | **0** | **0** | **44,600,000** | **42,097,753** | **2,502,247** |
| වයාපෘති අංකය..2.. හා නම : අමාත්‍යාංශ පරිපාලනය | | | | | | |
| පුද්ගල පඩිනඩි | 36,700,000 | | | 36,700,000 | 34,507,592 | 2,192,408 |
| අනෙකුත් වියදම් | 56,720,000 | | | 56,720,000 | 54,217,838 | 2,502,162 |
| උප එකතුව | **93,420,000** | **0** | **0** | **93,420,000** | **88,725,430** | **4,694,570** |
| මුළු එකතුව | **138,020,000** | **0** | **0** | **138,020,000** | **130,823,183** | **7,196,817** |

# ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම්

වියදම් ශීර්ෂ අංකය : **145** අමාත්‍යාංශයේ නම : **නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය**

වැඩ සටහන් අංකය හා නාමය : **2 - ගැටුම් වලින් බලපෑමට ලක්වූ ජනතාව නැවත පදිංචි කිරීමේ වැඩසටහන**

| ව්‍යාපෘති අංකය / නම, පුද්ගලික පඩිනඩි සහ සියළුම ව්‍යාපෘති සඳහා අනෙකුත් අයකිරීම් | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මු.රෙ.66, 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3) | (5) මුළු වියදම් | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (4-5) |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ව්‍යාපෘති අංකය. 3.. හා නම :..ගැටුම් වලින් බලපෑමට ලක්වූ ජනතාව නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය | | | | | | |
| පුද්ගල පඩිනඩි | 27,325,000 | | | 27,325,000 | 9,885,243 | 17,439,757 |
| අනෙකුත් වියදම් | 107,210,000 | | (46,650,000) | 60,560,000 | 59,422,886 | 1,137,114 |
| උප එකතුව | **134,535,000** | **-** | **(46,650,000)** | **87,885,000** | **69,308,129** | **18,576,871** |
| | | | | | | |
| මුළු එකතුව | **272,555,000** | **0** | **(46,650,000)** | **225,905,000** | **200,131,312** | **25,773,688** |

# <u>ව්‍යාපෘති අනුව මූලධන වියදම්</u>

වියදම් ශීර්ෂ අංකය : **145** අමාත්‍යාංශයේ නම : **නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය**

වැඩ සටහන් අංකය හා නාමය : **මෙහෙයුම් ක්‍රියාකාරකම්**

ව්‍යාපෘති අංකය හා නාමය: **1 - අමාත්‍ය කාර්යාලය**

| වැය විෂය අංකය | අයිතම අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) මු.රෙ.66, 69 අනුව මාරු කිරීම් පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2) | (4) මුළු වියදම | (5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (3-4) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| 2001 | | 11 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 300,000 | | 300,000 | 200,000 | 100,000 |
| 2002 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 400,000 | | 400,000 | | 400,000 |
| 2003 | | 11 | වාහන | 1,000,000 | | 1,000,000 | 999,955 | 45 |
| 2101 | | 11 | වාහන | | 9,420,155 | 9,420,155 | 9,420,154 | 1 |
| 2102 | | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 500,000 | | 500,000 | 483,049 | 16,951 |
| 2103 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 500,000 | | 500,000 | 452,695 | 47,305 |
| | | | එකතුව | **2,700,000** | **9,420,155** | **12,120,155** | **11,555,853** | **564,302** |

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : **145** අමාත්‍යාංශයේ නම : **නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය**

වැඩ සටහන් අංකය හා නාමය : **1 - මෙහෙයුම් වැඩසටහන**

ව්‍යාපෘති අංකය හා නාමය: **2 - අමාත්‍යාංශ පරිපාලනය**

| වැය විෂය අංකය | අයිතම අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) මු.රෙ.66, 69 අනුව මාරු කිරීම් පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2) | (4) මුළු වියදම | (5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /ඉක්මවීම් (3-4) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| 2002 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000 | | 500,000 | 207,000 | 293,000 |
| 2003 | | 11 | වාහන | 1,750,000 | | 1,750,000 | 1,749,935 | 65 |
| 2101 | | 11 | වාහන | | 13,200 | 13,200 | 13,170 | 30 |
| 2102 | | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 200,000 | -13,200 | 186,800 | 99,338 | 87,462 |
| 2103 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000 | | 500,000 | 494,190 | 5,810 |
| 2401 | | 11 | දැනුම වර්ධයනය සහ ආයතනික සංවර්ධනය | 300,000 | | 300,000 | 218,500 | 81,500 |
| 2502 | | 11 | අවිවේද වැඩ- මඩකලපු දිස්ත්‍රික්කය | | 5,200,000 | 5,200,000 | 4,218,738 | 981,262 |
| 2502 | | 11 | වෙනත් ආයෝජන - දැයට කිරුළ | 10,000,000 | | 10,000,000 | 9,092,349 | 907,651 |
| | | | එකතුව | **13,250,000** | **5,200,000** | **18,450,000** | **16,093,220** | **2,356,780** |

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : **145** අමාත්‍යාංශයේ නම : **නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය**

වැඩ සටහන් අංකය හා නාමය : **2 - සංවර්ධන වැඩසටහන**

ව්‍යාපෘති අංකය හා නාමය: **3 ගැටුම් වලින් බලපෑමට ලක්වූ ජනතාව නැවත පදිංචි කිරීමෙ වැඩසටහන**

| වැය විෂය අංකය | අයිතම අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) මු.රෙ.66, 69 අනුව මාරු කිරීම් පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2) | (4) මුළු වියදම | (5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (3-4) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| 2002 | | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 400,000 | | 400,000 | 68,890 | 331,110 |
| 2003 | | 11 | වාහන | 200,000 | | 200,000 | 199,359 | 641 |
| 2102 | | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 300,000 | | 300,000 | 300,000 | 0 |
| 2103 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,000,000 | (540,000) | 460,000 | 450,000 | 10,000 |
| 2401 | | 11 | දැනුම වර්ධයනය සහ ආයතනික සංවර්ධනය | 200,000 | | 200,000 | 80,000 | 120,000 |
| 2502 | 1 | 11 | වෙනත් ආයෝජන | | 41,990,000 | 41,990,000 | 41,959,991 | 30,009 |
| 2502 | 2 | 14 | වෙනත් ආයෝජන (පුත්තලම නිවාස ව්‍යාපෘතිය) | 170,000,000 | | 170,000,000 | 114,000,000 | 56,000,000 |
| 2502 | 2 | 17 | වෙනත් ආයෝජන (පුත්තලම නිවාස ව්‍යාපෘතිය) | 21,000,000 | | 21,000,000 | 21,000,000 | 0 |
| 2502 | 7 | 13 | යූ.එන්.එච්.සී.ආර්. | | 31,170,000 | 31,170,000 | 26,761,311 | 4,408,689 |
| 2502 | 10 | 13 | ඉන්දියානු රජය | | 10,656,400 | 10,656,400 | 10,656,400 | 0 |
| 2502 | 11 | 11 | වැලිඔය නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය | | 102,646,000 | 102,646,000 | 102,645,835 | 165 |
| | | | **එකතුව** | **193,100,000** | **185,922,400** | **379,022,400** | **318,121,786** | **60,900,614** |

# වියදම් මූල්‍යකරණ සාරාංශය

අමාත්‍යාංශයේ නම : **නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය**
වියදම් ශීර්ෂ අංකය : **145**
වැඩ සටහන් අංකය හා නාමය : **1 - 2 මෙහෙයුම් ක්‍රියාකාරකම් හා සංවර්ධන ක්‍රියාකාරකම්**

| මූල්‍යකරණය | | වැඩසටහන1 * | | වැඩසටහන 2 * | | මුළු එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය ** 1 | සත්‍ය වියදම 2 | ශුද්ධ ප්‍රතිපාදනය ** 3 | සත්‍ය වියදම 4 | ශුද්ධ ප්‍රතිපාදනය ** 5 | සත්‍ය වියදම 6 | වියදමේ ප්‍රතිශතය *** (6÷5)X100 |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | % |
| 11 | දේශීය අරමුදල් | 168,590,155 | 158,472,256 | 234,081,000 | 215,012,204 | 402,671,155 | 373,484,460 | 93 |
| 12 | විදේශීය ආධාර - ණය | | | | | | | |
| 13 | විදේශීය ආධාර - ප්‍රදාන | | | 41,826,400 | 37,417,711 | 41,826,400 | 37,417,711 | 89 |
| 14 | ප්‍රතිපූරණය කලහැකි විදේශීය ආධාර-ණය | | | 170,000,000 | 114,000,000 | 170,000,000 | 114,000,000 | 67 |
| 15 | ප්‍රතිපූරණය කලහැකි විදේශීය ආධාර-ප්‍රදාන | | | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | | |
| 17 | විදේශාධාර සම්බන්ධ දේශීය අරමුදල් | | | 21,000,000 | 21,000,000 | 21,000,000 | 21,000,000 | 100 |
| 21 | විශේෂ නීති සේවා | | | | | | | |
| | එකතුව | 168,590,155 | 158,472,256 | 466,907,400 | 387,429,915 | 635,497,555 | 545,902,171 | 86 |

ඩී.ජී.එස්.ඒ - 5 (i)

# වියදම් මූලාකරණය

**(වැඩසටහනක ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් වල ඓක්‍යය)**

**අමාත්‍යාංශයේ නම : නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය**

වියදම් ශීර්ෂ අංකය : 145

වැඩ සටහන් අංකය හා නාමය : 1-මෙහෙයුම් ක්‍රියාකාරකම්

| මූලාකරණය | | ව්‍යාපෘති 1 | | ව්‍යාපෘති 2 | | ව්‍යාපෘති 3 | | වැඩසටහනේ එකතුව/පිටුවේ එකතුව* | |
|---|---|---|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 11 | දේශීය අරමුදල් | 56,720,155 | 53,653,606 | 111,870,000 | 104,818,650 | - | - | 168,590,155 | 158,472,256 |
| 12 | විදේශීය ආධාර - ණය | | | | | | | | |
| 13 | විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | | |
| 14 | ප්‍රතිපූරණය කල හැකි විදේශීය ආධාර - ණය | | | | | | | | |
| 15 | ප්‍රතිපූරණය කල හැකි විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | | | |
| 17 | විදේශාධාර සම්බන්ධ දේශීය අරමුදල් | | | | | | | | |
| 21 | විශේෂ නීති සේවා | | | | | | | | |
| | එකතුව | **56,720,155** | **53,653,606** | **111,870,000** | **104,818,650** | **-** | **-** | **168,590,155** | **158,472,256** |

# වියදම් මූලයකරණය

**(වැඩසටහනක ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් වල ඓක්‍යය)**

**අමාත්‍යාංශයේ නම : නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය**

වියදම් ශීර්ෂ අංකය : 145

වැඩ සටහන් අංකය හා නාමය : **2 - සංවර්ධන ක්‍රියාකාරකම්**

| මූලයකරණය | | ව්‍යාපෘති 1 | | ව්‍යාපෘති 2 | | ව්‍යාපෘති 3 | | වැඩසටහනේ එකතුව/පිටුවේ එකතුව* | |
|---|---|---|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 11 | දේශීය අරමුදල් | - | - | - | - | 234,081,000 | 215,012,204 | 234,081,000 | 215,012,204 |
| 12 | විදේශීය ආධාර - ණය | | | | | | | | |
| 13 | විදේශීය ආධාර - ප්‍රදාන | | | | | 41,826,400 | 37,417,711 | 41,826,400 | 37,417,711 |
| 14 | ප්‍රතිපූරණය කල හැකි විදේශීය ආධාර - ණය | | | | | 170,000,000 | 114,000,000 | 170,000,000 | 114,000,000 |
| 15 | ප්‍රතිපූරණය කල හැකි විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | | | |
| 17 | විදේශාධාර සම්බන්ධ දේශීය අරමුදල් | | | | | 21,000,000 | 21,000,000 | 21,000,000 | 21,000,000 |
| 21 | විශේෂ නීති සේවා | | | | | | | | |
| | එකතුව | - | - | - | - | **466,907,400** | **387,429,915** | **466,907,400** | **387,429,915** |

# නැවත පදිංචි කිරීමේ අමාත්‍යංශය

**මුරෙ. 506(1) අනුව 2012 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ සැසඳුම් ප්‍රකාශය**

| විස්තරය | උපරිම වියදම් සීමාව<br>රු. | අවම ලැබීම් සීමාව<br>රු. | උපරිම හර ශේෂ සීමාව<br>රු. |
|---|---|---|---|
| විසර්ජන පනත අනුව අනුමත සීමාව | **4,000,000.00** | **2,500,000.00** | **13,000,000.00** |
| 2012 වසර තුල සත්‍ය වියදම/ ලැබීම | 2,861,395.00 | 3,017,028.81 | |
| හරස් සටහන අනුව 2012 වසර තුල සත්‍ය වියදම් / ලැබීම් | 705,608.00 | 2,517,727.50 | |
| | | | |
| **එකතුව** | **3,567,003.00** | **5,534,756.31** | **9,110,270.59** |

# නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය

## 2012 දෙසැම්බර් 31 දිනට පුද්ගල ණය ශේෂ සැසඳුම් ප්‍රකාශය

**අත්තිකරම් බී ගිණුමේ විෂය අංකය - 145011**

| විස්තරය | මුදල (රු) | එකතුව (රු) |
|---|---|---|
| **දෙපාර්තමේන්තු නිලධාරීන්ගෙන් අයවීමට ඇති ණය මුදල් වල එකතුව** | | |
| අමාත්‍යාංශය | 8,162,946.84 | |
| දිස්ත්‍රික් වල අනුයුක්ත කර ඇති නිලධාරීන් | 1,079,258.91 | **9,242,205.75** |
| පුද්ගලික ණය ශේෂයන්ට අදාල එකතුකිරීම් | | - |
| අඩුකිරීම් - මුරෙ. 503 අනුව සැකසීම් | | 9,919.16 |
| **දෙපාර්තමේන්තු පොත් අනුව බැර ශේෂයන්හි එකතුව** | | **9,232,286.59** |

# නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය

**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් සහ ණය සඳහා පාලන ගිණුම - 2012**
**අත්තිකරම් බී ගිණුමේ විෂය අංකය - 145011**

| විස්තරය | දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය (රු) | භාණ්ඩාගාර මුද්‍රිත සටහන අනුව ශේෂය (රු) |
|---|---|---|
| **2012 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය (ඒ)** | **11,200,039.90** | **11,078,023.90** |
| **එකතු කිරීම්** | | |
| 145011 වසර තුල මුදල් ලැබීම් | 2,861,395.00 | 2,861,395.00 |
| 145012 වසර තුල හරස් සටහන අනුව මුදල් ලැබීම් | 705,608.00 | 705,608.00 |
| **2012 වසර තුල මුදල් ලැබීම් එකතුව (බී)** | **3,567,003.00** | **3,567,003.00** |
| **අඩු කිරීම්** | | |
| 145011 වසර තුල මුදල් ගෙවීම් | 3,017,028.81 | 3,017,028.81 |
| 145012 වසර තුල හරස් සටහන අනුව මුදල් ගෙවීම් | 2,517,727.50 | 2,517,727.50 |
| **2012 වසර තුල මුදල් ගෙවීම් එකතුව (සී)** | **5,534,756.31** | **5,534,756.31** |
| 2012 දෙසැබර් 31 දිනට අවසාන ශේපය ( ඒ + බී + සී ) | **9,232,286.59** | **9,110,270.59** |

**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණමේ ශේෂය සඳහා වූ දෙපාර්තමේන්තු පොත් සහ භාණ්ඩාගාර පොත් සමග සැසදුම් ප්‍රකාශය**

| විස්තරය | | රු. |
|---|---|---|
| **දෙපාර්තමේන්තු පොත් අනුව 2012 දෙසැම්බර් 31 දිනට අවසාන හර ශේෂය** | | 9,232,286.59 |
| **අඩුකිරීම් - මුරෙ 503 අනුව සැකසීම** | | 122,016.00 |
| **භාණ්ඩාගාර පොත් අනුව 2012 දෙසැම්බර් 31 දිනට අවසාන හර ශේෂය** | | **9,110,270.59** |

# විගණන විමසුම්

විසර්ජන ගිණුම - 2012
ශීර්ෂය - 145 නැවත පදිංචිකිරීමේ අමාත්‍යාංශය
----------------------------------------------------

1. මුදල් රෙගුලාසි 50 (ආ) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවත්, මුල් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් වැය විෂයයන් 12 කට අදාලව සියයට 23 සිට සියයට 92 දක්වා පරාසයක් තුල ඉතිරිවීම් සිදුවී තිබුණි. ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී අදාල වියදම නිවැරදිව පුරෝකථනයක් සිදු නොකිරීමද මෙම ඉතිරිවීම් ඇතිවීමට හේතුවී ඇති බැව් නිරීක්ෂණය විය.

2. වැය විෂයන් 15 ක එකතු වටිනාකම වූ රු.1,555,812.00 ක් සඳහා බැරකම් විසර්ජන ගිණුමේ සටහන් කර නොතිබුණි.

3. වැය විෂයයන් 13 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට වූ ඉතිරිය රු.147,005.00 ක් වූ අතර එදිනට එම විෂයයන් වූ බැරකම්වල එකතුව රු.1,505,814.00 ක් විය. ඒ අනුව වර්ෂය අවසානයට ඉතිරිවූ ප්‍රතිපාදන ඉක්මවා රු.1,358,809.00 ක් වගකීම්වලට බැඳී තිබුණි.

4. 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842 අනුව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගත යුතු වුවද, අමාත්‍යාංශය යටතේ රු.114,617,018.00 ක් වටිනාකමැති ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි.

5. මුදල් රෙගුලාසි 571 ( 2 ) ජේදයට අනුව තැන්පත් ගිණුමෙහි ඉකුත් කාල පරිච්ජේදයන්ට අදාලවූ ඉකුත් වූ තැන්පතු රාජ්‍ය ආදායමට බැරකළ යුතු වුවත්, අමාත්‍යාංශය එසේ කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රු.7,959,996.00 ක් වර්ෂ 02 කට වැඩි කාලයක් රඳවාගෙන තිබුණි.

විගණකාධිපති සටහන
------------------------

2011 අංක 52 දරන විසර්ජන පනතේ පළමු උපලේඛනයේ ශීර්ෂ 145 ට අදාල නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ 2012 වර්ෂය සඳහා වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ, මුදල් රෙගුලාසි (මු.රෙ) 150 හා 2012 නොවැම්බර් 26 දිනැති අංක 227/2012 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව විගණනයට ඉදිරිපත් කරන ලදි. එකී විසර්ජන ගිණුම භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සහ අයවැය ඇස්තමේන්තු සහ කාර්යාලයේ පොත්පත්, ලේඛන හා වාර්තා සමඟ පරීක්ෂා කරන ලද අතර, එම ගිණුමට අදාල විගණන නිරීක්ෂණ මෙයට යා කර ඇත. වැය ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

……………………………….
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

2013 ජුනි 11 දින,
විගණකාධිපති දෙපාර්තමේන්තුවේදීය.

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
පොල්දූවපාර,
බත්තරමුල්ල.

**<u>ශීර්ෂය – 145 විසර්ජන ගිණුම් විගණනය - 2012</u>**

ඔබගේ විගණන විමසුම් අංක ඩීර්/පී/ආර්එම්/විවි/2012 හා 2013-05-29 දිනැති විගණන විමසුම හා බැදේඉහත සඳහන් කරුණු පිලිබඳව මාගේ අදහස් පහත සඳහන් කරමි.

**01. ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා**

2012 මුදල් වසර තුල මුහුණ දුන් විශේෂ හේතුන් මත ඇතැම් වැය විෂයන්හි ප්‍රතිපාදන ඉතිරි වුවද එය සම්පූර්ණයෙන්ම අධි ඇස්තමේන්තු මත සිදුවූ ඒවා නොවේ. රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීමේ අරමුණින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ අංක 155 හි පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් 2% ක් ද මූලධන ප්‍රතිපාදනයෙන් 9% ක්ද ඉතිරි කිරීමට කටයුතු කළයුතු බව දැක්විණි.

කෙසේ වුවත්, ඇතැම් ප්‍රායෝගික හේතුන් මත සෑම වැය විෂයකින්ම ඉතිරි කිරීම් සිදුකල නොහැකි බැවින් සමස්ත පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් 2% ක් සහ සමස්ථ මූලධන ප්‍රතිපාදනයෙන් 9% ක් ගණනය කර වසර අවසානයේ ඉතිරිවීම් ඇති විය හැකි යැයි උපකල්පනය කළ හැකි වැය විෂයන් කිහිපයකින් එම ඉතිරි කිරීම් සිදු කිරීමට හැකි වන පරිදි ප්‍රතිශෝධිත ඇස්තමේන්තුවක් පිළියෙල කර ඒ අනුව වියදම් කළමනාකරණය කරන ලදී. ඔබගේ පහසුව සඳහා එහි පිටපතක් මේ සමග අමුණා එවමි. ඒ අනුව විගණන විමසුමෙහි දක්වා ඇති ඇතැම් වැය විෂයන්හි ඉතිරි වීම් පෙන්නුම් කරන අතර නියමිත ප්‍රමාණයන් ඉක්මවාද ඇතැම් වැය විෂයන්හි ඉතිරි වීම් සිදුවී ඇත.

මෙයට අමතර වශයෙන් ප්‍රතිපාදන ඉතිරිවීම කෙරෙහි බලපෑ තවත් තීරණාත්මක සාධකයක් නම් මෙම අමාත්‍යාංශය යටතේ තිබූ පුත්තලම නිවාස ව්‍යාපෘතිය 2012 වසරේ අවසන් වීම නිසා භාවිතයෙන් ඉවත් කරන ලද සම්පත් අමාත්‍යාංශයේ පරිහරණය සඳහා ලබා ගැනීමය. එබැවින් කලින් සැලසුම් කරන ලද නව භාණ්ඩ මිලදී ගැනීම සහ අලුත් වැඩියා කිරීම ඉටු කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනැගිණි. එම තත්ත්වය අදාල වැය විෂයන්හි ප්‍රතිපාදන ඉතිරි වීමට දායක විනි.

**02. බැරකම්**

(i) බැරකම් සටහන් නොවීම.

2012 විසර්ජන ගණුමට අදාල බැරකම් ප්‍රකාශය සකස් කිරීමේදී ඇතිවූ දෝෂයක් හේතුවෙන් මෙම බැරකම් සටහන් නොවීම සිදුව ඇත. මින් ඉදිරියේදී මෙවැනි වැරදි සිදු නොවීමට කටයුතු කරනු ලැබේ.

**(ii) බැරකම් සඳහා ඉතිරි කිරීම් ප්‍රමාණවත් නොවීම**

2012 වසරට අදාල ඇස්තමේන්තු ප්‍රතිපාදන ඉක්මවා වගකීම් භාර ගැනීමට සිදුවී ඇත්තේ විවිධ ප්‍රායෝගික හා රාජකාරි අවශ්‍යතා මත අමාත්‍යාංශ කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍යයෙන් දැරිය යුතු භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කර ගැනීමට සිදුවීමෙන් ගත් අවස්ථානුකූව කළමනාකරණ තීරණ ගැනීම හේතුවෙනි. කෙසේ වෙතත්, ඉදිරියේ එක් එක් වසරට අදාල වියදම් එම වසර තුළදීම නිරවුල් කරීම මගින් ප්‍රතිපාදන කළමණාකරණය කර ගැනීමට උපරිමයෙන් කටයුතු කරනු ඇත.

**03. ස්ථාවර වත්කම් ලේඛණය**

2013-02-27 දින අමාත්‍යාංශය විසින් ස්ථාවර වත්කම් ලේඛණය රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇති අතර පහසුව සඳහා අදාල ලිපියෙහි පිටපතක් මේ සමග අමුණා එවමි.

**04. පොදු තැන්පත් ගිණුම**

මුරෙ. 571(2) ජෙදයට අනුව තැන්පත් ගිණුමෙහි වසර 2ක කාලය ඉක්මවූ තැන්පත් 2013 මැයි මස රජයේ අදායමට බැර කර ඇත.

ජනක සුගතදාස,

ලේකම්,

නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය.